ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

තොරතුරු විශේෂඥයකු, පුස්තකාලවේදියකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට පුරෝගාමී විද්වත් වෘත්තීය අධ්‍යාපන ආයතනයෙන් ඔබටත් අවස්ථාවක්

පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - 2024/2025 අධ්‍යයන වර්ෂය

ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සුදුසුකම්

1	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම **හෝ**
2	i. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම **සහ** ii. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකක් සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව ඉංග්‍රීසි භාෂාව සමඟ විෂයයන් 6ක් එකවර සමත් වී තිබීම.
3	පිළිගත් පුස්තකාලයක ස්ථිර සේවයේ නියුතුව වසර 03 ට නොඅඩු පළපුරුද්ද සහ ඉහත 2 (ii) සම්පූර්ණ කර තිබීම.

- **මෙම පාඨමාලාව රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල තොරතුරුවේදී / පුස්තකාලවේදී වෘත්තීය සඳහා ඇතුළත්වීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගනු ලබයි. එසේම මෙම පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් ආචාර්ය උපාධිය දක්වා උසස් අධ්‍යාපන අවස්ථාවන් ද හිමි කරගත හැකිය.**



පාඨමාලා ක්‍රමවේදය සහ ගාස්තුව

1. **අධ්‍යයන ක්‍රමවේදය** - මාර්ගගත හා පන්ති කාමර ක්‍රමවේදයන්ට අනුව පැවැත්වේ.
2. **පාඨමාලාවේ කාලසීමාව** - වසරකි
3. **අධ්‍යයන මාධ්‍යය** - දේශන ඉරිදා දිනවල සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුනෙන්ම පැවැත්වේ.
4. **පාඨමාලා ගාස්තුව** - රු. 25,000/-කි.
5. **පාඨමාලා ආරම්භය** - 2025 ජනවාරි

අයදුම්පත් විස්තර සහ ලබාගත යුතු ක්‍රමය

1. අයදුම්පත් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වෙබ් අඩවියෙන් ලබාගත හැක. **(www.slla.lk)**
2. අයදුම්පත් ගාස්තුව වන රු. 1000/- ක මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ගිණුම් අංකයට 0002323087 තැන්පත් කොට <u>බැංකු තැන්පතු පතෙහි මුල් පිටපත සමග නිසි ලෙස පිරවූ අයදුම්පත සහ අදාළ අධ්‍යාපන සහතිකපත්වල ඡායා පිටපත් සමග</u> අප ආයතනය වෙත පහත සඳහන් ලිපිනයට තැපෑලෙන් එවිය යුතු වේ.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: **2024 දෙසැම්බර් 20**

ලිපිනය :

අධ්‍යාපන නිලධාරි, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, 275/75, විද්වත් වෘත්තික මධ්‍යස්ථානය, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07.

වෙබ් ලිපිනය - www.slla.lk විමසීම් - 0112589103, 0715421421 / විද්‍යුත් තැපෑල - education.slla@gmail.com